සුදු මුවා

© සිංහල අනුවාදය, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්, 1974

සෝවියට් සංගමයේ මුද්‍රණය කරන ලදි.

සුදු මුවා

ලැව්වියාතු ජාතක කතාවකි

චිත්‍ර : නිකොලායි කොචෙර්ගින්

අනුවාදය : දැදිගම. වී. රුද්‍රිගු

ශුද්ධීලා කොපිලෝවා විසින් සකස් කරන ලදී

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

මොස්කව්

ඇහැට පෙනෙන අතට අනු-
නොවන විදුලිය වේගයෙන්
දුවන දිග අ- ඇති සුදු මූවා-
ගේ කතාව පොඩිත්තන් සඳ-
හාය.

එකෝමත් එක රටක සහෝදරයෝ දෙදෙනෙක් හිටියා. කරන හැම වැඩක්ම මේ දෙදෙනා බොහොම සමගියෙන් කළා. උස, මහත යෝධයින් වගේ දෙදෙනා හැදී වැඩුණා. එක් දවසක් තාත්තා පුතුන් දෙදෙනාට කතා කරලා මෙහෙම කිව්වා:

"නුඹලා කැමති මොන රස්සාවටද?"

දෙදෙනාම හිස වනලා කල්පනා කරලා උත්තර දුන්නා:

"වඩුවැඩට කැමතියි. දඬයම් කිරීම වැඩිය හොඳයි. පාත්තයින්, කැලෑ තාරාවුන්, හංසයින් අල්ලා ගන්නට පුළුවනි."

නාත්තා පුතුන් දෙදෙනාට දුනු දෙකකුයි, ඊතලයි, දඩයම් බල්ලන් දෙදෙනෙකුයි දුන්නා. ඔහු පුතුන් දෙදෙනාට සුබ පතලා ඔවුන්ගෙන් සමු ගත්තා.

සහෝදරයෝ දෙදෙනා බොහොම දුර ගිහිල්ලා, ලොකු කැලෑවකට ආවා. පාත්තයින්, කැලෑ තාරාවුන්, හංසයින් හොයමින් මේ දෙදෙනා කැලෑවේ හැම තැනම ඇවිද්දා. දඩයම් කිරීම ලෙහෙසි නැති බව තේරුණේ එතකොටයි. කැලෑව මැදින් ගිය මේ දෙදෙනාට පාර හොයා ගැනීමට බැරිවුණා. නාත්තා දුන් කෑමත් ඉවර වෙගන එනවා. එකම සතකුවත් දඩයම් කිරීමට බැරිවුණා.

ඔන්න එතකොට මූවෝ දෙදෙනෙක් දුව ගෙන ආවා. අයියයි, මල්ලියි දුනු අතට ගත්තා.

"අනේ, අපව මරන්න එපා. ඔබට උදව් වීමට අපි ඕනෑම වේලාවක එනවා" කියලා මූවෝ කිව්වා.

දෙදෙනාම මූවන් මරන්නේ නැතිව යන්ට ගියා. ඔහොම යන කොට මේ දෙදෙනාට වෘකයින් දෙදෙනකු හමුවුණා. අයියයි, මල්ලියි දුනු අතට ගත්තා.

"අනේ, අපව මරන්න එපා. ඔබට උදව් වීමට අපි ඕනෑම වේලාවක එනවා" කියලා වෘකයෝ කිව්වා.

අයියයි, මල්ලියි උන්ව නොමරා යන්ට ගියා. ටිකක් දුර යන කොට මේ ගොල්ලන්ට හාවුන් දෙදෙනකු හමුවුණා. ආයෙමත් මේ දෙදෙනා දුනු අතට ගත්තා.

"අනේ, අපව මරන්න එපා. ඔබට උදව් වීමට අපි ඕනෑම වේලාවක එනවා," කියලා හාවෝ කිව්වා.

ඔය විදිහට අයියටයි, මල්ලිටයි උදව් වීමට කැලෑසත්තු හය දෙනෙක් ඉදිරිපත් වුණා. අයියටයි, මල්ලිටයි දඩයම බල්ලෙකුයි, මූවකුයි, වෘකයෙකුයි, හාවකුයි බැගින් හිටියා.

දෙදෙනාම තවත් දුර කැලෑවේ ගිහිල්ලා ලොකු නුග ගහක් ළඟට ආවා. යන්න ඕන කොයිපැත්තටද කියන එක ගැන මේ දෙදෙනා වාදකළා. තනි තනිව ගිහිල්ලා වාසනාව හොයාගන්ට ඕනයි කියලා දෙදෙනා තීරණය කළා. අයියා තමාගේ පිහිය අරගෙන නුග ගහට ඇනලා මල්ලිට කතා කරලා මෙහෙම කිව්වා: "මල්ලිත් නුග ගහට පිහියෙන් අනින්න. අපට හොඳක් සිදුවුණොත් අපේ පිහි මලකඩ නොකා තියේවි. නරකක්

සිදුවුණොත් පිහි මලකඩ කාවි. ඉතින් විපතට වැටුණු කොට උදව් දීමට අනිකා එන්න ඕන.'' ටික කලකට පස්සෙ දෙදෙනාම නුග ගහ ළඟට ඇවිත් පිහි ගැන හොයා බැලීමට පොරොන්දු වුණා. පසුව දෙදෙනාම දෙපැත්තට යන්ට ගියා.

අයියා දවසක් ගමන් කළා, දවස් දෙකක් ගමන් කළා. කිසිම දඩයමක් හොයා ගන්ට බැරිවුණා. තුන්වැනි දවසේදී අයියා රජ මාලිගාවක් දැක්කා. මාලිගාව බොහොම ලස්සනයි. මාලිගා බිත්ති තේක්ක ලියෙන් හදලා, ඉස්සරහ පැත්ත ගුරුත ලියෙන් හදලා, මාලිගා කුළුණ බොහොම උසයි. අහල පහළ කවුරුවත් පේන්න හිටියේ නැහැ. මාලිගාව ඇතුළේ කුමරියක් හිටියා.

''කුමරිය! මෙහි හිටිය මිනිස්සු කොහි ගියාද?'' කියලා අයියා ඇහුවා.

''දිග අං තියෙන සුදු මූවාව අල්ලා ගන්ට උෆ පස්සෙ දිව්වා. ඒ ගොල්ල හැම දෙනම ගිටි හැටියේම ගල් ගැහුණා. මගේ පිය රජ තුමාත් පරුවතයක් වුණා.'' කුමරිය කිව්වා.

''කුමරිය, කන්‍යාවටුවෙන්ට එපා. ඒ ගොල්ල ගියේ උදව් කාරයො නැතුව නේද? බලන්න මා ළඟ ඉන්න සතුන් දිහා. සුදු මූවාව අල්ලා ගෙන රජතුමාට නැවත පණ ලබා දෙන්නම්,'' කියලා අයියා කුමාරිව සැනසුවා.



අයියා මාලිගා වත්තෙන් එළියට ඇවිත් වටපිට බැලුවා. ඔන්න එතකොට දිග අං ඇති සුදු මුවා දුවන හැටි ඔහු දැක්කා. ඔහු තමාගේ දඩයම් බල්ලයි, මුවායි, වෘකයයි, හාවයි සමග එකතුවෙලා සුදු මුවා පස්සේ එළවන්ට පටන් ගත්තා. සුදු මුවා දුවලා, දුවලා ගිහින් අතුරුදන් වුණා. හැමතැනම මී දුමකින් වැසී ගියා. ඔන්න එතකොට ආච්චි කෙනෙක් ගස් කොටයක් උඩ ඉඳගෙන ගිනි තපින හැටි අයියා දැක්කා.

"අනේ ආච්චියේ, බොහොම හිතලයි, ගිනි තපින්ට මට අවසර දෙනවද?" අයියා ඇහුවා.

"අවසර දෙන්නම්! ඒක මට පාඩුවක් නොවේ. ඉස්සෙල්ලා නුඹගේ සතුන්ව අතගාන්ට අවසර දීපන්. නැතිනම් අමනක වේවි!"

"ඕන තරම් අතගාන්න" ඔහු කිව්වා.

ඒ ආච්චි මායාකාරියක්. ඇ සතුන්ව අත ගැවා විතරයි උන් ගල් ගැහුණා. අයියාත් •පරුවතයක් බවට පත්වුණා.

මල්ලි බටහිර ඉඳලා නැගෙනහිරට ගිහිල්ලා, එක රජකු ළඟ එඩේර රස්සාවක් ලබා ගත්තා.

හිටි හැටියේම ඒ රටට ලොකු විපතක් සිදුවුණා. මහ මුහුදේ ඉඳලා ලොකු මකරෙක් ගොඩ ඇවිත් රජුගේ දු කුමරියන් තුන්දෙනාව බිල්ලට ඉල්ලා හිටියා. නැතිනම් රට වනසනවා කියලා මකරා කෑ ගහලා කිව්වා. මුහුදු ගලා යවලා රට ගිල්වනවා කියලා ඌ රජතුමාව බිය කළා.

රට බේරා ගැනීමට එන කෙනෙකුට බාල කුමාරිව විවාහ කර දෙනවා කියලා රජතුමා අණබෙර ගහලා දන්නුවා. ඒ වැඩේ කළ හැකි කෙනෙකු හොයා ගන්ට බැරිවුණා.

රජතුමා ඇඬුවා, වැළපුණා, කනගාටු වුණා. එයින් පිහිටක් වුණේ නැහැ. පනුවදා උදේට වැඩිමල් කුමාරිව මකරාට බිලි දෙන්න ඕන. මේ ගැන දැනගත් මල්ලි කල්පනා කළා: "හරි වැඩක් නෙව. කිසිම තේරුමක් නැතිව කුමාරිව මකරාගේ කටට විසි කරන්ට යනවා." දහවල් කාලෙදි සතුන් බලන රස්සාව කළ මල්ලි හවස් වුණාම තමාගේ යාළු සතුන් සමග එකතුවෙලා කඩුවක් හදලා එය හොඳට මුවහත් කළා. උදේ වෙනකොට කඩුව හදලා ඉවරයි.

උදේ පාන්දර රජ ගෙදර රිය කරුවා වැඩිමල් කුමාරිව රියේ නංවාගෙන මකරා ළඟට ගෙන ගියා. මේ රිය ගමන් කළේ මල්ලි සතුන්ට තණ කවන පිටිය හරහා.

"නුඹ උදෙන්ම යන්නේ කෙහේද?" කියලා මල්ලි රිය කරුවාගෙන් ඇහුවා.

"මකරා ළඟට මිසක් වෙන කොහාටද? එඬේරා නුඹ අහන්නේ ඇයි? මකරාගේ කටේ තියෙන දත් ගණන්කරන්ටද?" කියලා රිය කරුවා විහිලු කළා.

"මට බැරිය කියල නුඹ හිතනවද?" මල්ලි රිය කරුගෙන් ඇහුවා. ඊට පස්සේ මල්ලි තමාගේ යාළු සතුන් සමග රිය පිටු පසින් ගියා.

රියකරු මුහුදු වෙරළ අයිනේ රිය නැවැත්තුවා. වැඩිමහල් කුමරිය රියෙන් බිමට බැහැලා අඬන්ට පටන් ගත්තා. කොහොම හරි බේරාගන්ටයි කියලා කුමාරි රියකරුගෙන් ඉල්ලා හිටියා. රියකරු බොහොම බියවෙලා රියයි, අශ්වයයි වෙරළින් එහාට ගෙනගියා. මකරා මරා දැමීමට ඔහු ළඟ කඩුවක් තිබුණේ නැහැ.

මුහුදේ විශාල රැල්ලක් ඇති වෙලා, වතුර කළු පාට වුණා. ඔලු තුනක් ඇති මකරෙක් මුහුදෙන් මතුවුණා. මල්ලි අස්සයා පිට නැ-

ගිලා, මකරා ළඟට ගිහින්, උගේ ඔලු තුනම කපා දැම්මා. මකරාගේ දිව-වල්තුන කපාගෙන ඒවා එඩේර මල්ලේ දමාගෙන, කතා නොකර යන්ට ගියා. බයවෙලා බලාගෙන හිටිය රියකරුට කපටි, නපුරු අදහසක් හිතුනා. ඔහු කුමරිය ළඟට ගිහිල්ලා ඇව ඕය කළා.

"අපි නුඹව බේරා ගත්තු හැටි නුඹ දැක්කා නෙවද. නුඹ රජතුමාට එඩේරා ගැන කියන්ට එපා. ඔහු ගැන කිව්වොත් මම නුඹව මරා දමනවා. රජතුමා ඇහුවොත් මෙහෙම කියපන්: ගෙන ගියෙත් රියකරු, ගෙනාවෙත් රියකරු. තැගි ඔහුට දෙන්න."

වැඩිමහල් කුමරිය බයවෙලා, ඔහු කියන විදිහට කියන්ට පොරොන්දු වුණා.

පහුවදා උදේ ඔලු හයක් ඇති මකරෙක් මුහුදෙන් මතුවෙලා කෑ ගැහුවා.

රජගෙදර රිය කරුවා මද්දුම කුමරිව රියේ නංවාගෙන, මල්ලි සතුන්ට තණ කවමින් හිටිය තණ පිටිය හරහා රිය පදවාගෙන ගියා. මල්ලි අස්සයා පිට නැගිලා කඩුවත් අරගෙන මකරා ළඟට ගිහින් උගේ ඔලු හයම කපා දමලා, කුමාරිව බේරා ගත්තා. ඔහු මකරාගේ දිවවල් හයම කපාගෙන, එඩේර මල්ලේ දමාගෙන, කතා නොකර යන්ට ගියා.

රිය කරු මද්දුම කුමරිය බය කළා. නුඹව බේරා ගත්තේ මායි කියල රජතුමාට කියපන්, නැතිනම් නුඹව මරා දමනවා, කියල කිව්වා. කුමරිය කැමති වුණා.

තුන්වැනි දවසේදීත් රිය කරුවා බාල කුමරිය රියේ නංවාගෙන යනහැටි එඩේරා දැක්කා. ඔහු කඩුවත් අරගෙන අස්සයා පිට නැගිලා රිය පිටුපසින් ගියා.

රියකරු රිය වෙරළට ගෙනල්ලා බාල කුමරිට බහින්ට කිව්වා. එතකොට කුමරිය ඇව බේරාගන්ට කියලා අඬ අඬා රිය කරුට කිව්වා. මකරාට බයවෙලා රියකරු රියත් අරගෙන ඇතට ගියා. රියකරු ළඟ කඩුවක් නැහැ. ඉතින් එයා කොහොමද මකරාව මරන්නේ! ඒ විතරක් නොවෙයි. රියකරු හැබෑ බියගුල්ලා. මහ මුහුදේ මහා කුණාටුවක් ඇති වෙලා, ඔලු නවයක් ඇති විශාල මකරෙක් දියෙන් මතුවුණා. එතකොට එඩේරා මකරා ළඟට ගිහින් උගේ ඔලු නවයම කපා දැම්මා. බාල කුමරිය බොහොම සතුටු වෙලා එඩේරාට එයාගේ පේරිස් මුද්ද තැගි කළා. බයේ වෙවුල, වෙවුලා හිටිය රියකරු එය දැක්කේ නැහැ. එඩේරා ඇයට හිස නමා ආචාර කළා. ඔහු මකරාගේ දිවවල් නවයම කපා ගෙන, තමාගේ එඩේර මල්ලේ දමාගෙන, කතා නොකර යන්ට ගියා. තණ පිටියට ගිහිල්ලා සතුන් රැක බලා ගත්තා.



රියකරු බාල කුමරියත් බය කරලා මෙහෙම කිව්වා:

"නුඹ දක්කා නේද, අපි නුඹව බේරා ගත්තු හැටි! එඩේරා ගැන රජතුමාට වචනයක්වත් කියන්ට එපා. රියකරුවා ගෙන ගියා, රියකරුවා ගෙනාවා. ඔහුට තැගි දෙන්න කියල රජතුමාට කියපන්. නැතිනම් මම නුඹව මරා දමනවා."

බාල කුමරිය මැරෙන්න කැමති වුණේ නැහැ. රිය කරුවා කියන විදිහටම කියන්ට ඇ කැමති වුණා.

රජතුමා බොහොම සන්තෝස වුණා. රියකරුව බදාගෙන, සිපගෙන, මෙහෙම කිව්වා:

"නුඹ මගේ දු කුමරියන් තුන්දෙනාම බේරා ගත්තා. හැබෑ වීරයා! මගේ බාල දුව නුඹට සරණ පාවා දෙනවා. රටෙන් බාගයකුත් නුඹට දෙනවා."

රජතුමා කියපු විදිහටම වැඩ කළා. තව දවස් තුනකින් රජගෙදර මඟුලක්. එඩේරාට මේ ගැන ආරංචි වුණා. ඔහු එඩේර මල්ලත් අරගෙන හොරෙන් රජවාසලට ඇතුළු වුණා.

බාල කුමරිය එඩේරාව දකලා සතුටුවෙලා රජතුමා ළඟට ගියා:

"පිය රජතුමනි! මාව මකරාගෙන් බේරා ගත්ත වීරයාට මම, මගේ පේරැස් මුද්ද තෑගි කළා. ඔහුට මාව සරණ පාව දෙන්න," කියලා කිව්වා.

මේ වේලාවේදී රියකරු රසැකි පානයක් ගෙනැවිත් බාල කුමරිට දුන්නා. ඇ එයින් උගුරක් බීලා රන් බඳුන එඬේරාට දුන්නා. එඬේරා තම ඇඟිල්ලක තිබුණු පේරැස් මුද්ද ගලවා රජතුමාට පෙනෙන්නට රන් බඳුනට දැම්මා. රියකරු එය දැක්කේ නැහැ.

"මෙයා තමා මාව බේරාගත් වීරයා." බාල කුමරිය රජතුමාට එඬේරාව පෙන්නුවා.

රජතුමා විශ්වාස කළේ නැහැ.

"මාව බේරාගත්ත මිනිහා සහ මකරාගේ දිව්වල් තියෙන්ට ඕන. පිය රජතුමා ඉදිරියට මකර දිව්වල් ගෙනා කෙනෙකුට මාව පාවා දෙන්න" කියලා බාල කුමරිය ඉල්ලා සිටියා.

රජතුමා රියකරුට කතා කළා:

"හනිකට මකර දිව්වල් ගෙනැවිත් පෙන්නා පන්. මගුල් මෙසයට වාඩිවෙන්න වෙලාව හරි!"

මකර දිව්වල් කොහෙන් ගේන්ටද? රියකරුවා ගොළුවුණා.

එඬේරා බාල කුමරිය සහට ඇවිත්, මකර ඔලු දහ අටටම අයිති දිව්වල් දහඅට එඬේර මල්ලෙන් එළියට ගෙන, රජතුමාට පෙන්නුවා!

ඔන්න ඒ පාර තමයි රජතුමා බාල දුගේ කීම විශ්වාස කළේ.

රනින් කළ රජ ඇඳුම් එඬේරාට අන්දවන්ට රජතුමා නියම කළා. බාල කුමරිය ඔහුට සරණ පාවා දුන්නා. රියකරුව රජවාසලින් පන්නා දැම්මා. රජතුමා රටින්

බාගයක් එඬේරාට නැගි කළා. එඬේරා කුමරියත් සමග බොහොම සතුටින් ජීවත් වෙනවා.

ඔහොම ඉන්න කොට දවසක් දා ඔහුට තම අයියා ගැන මතක් වුණා. නුග ගහ ළඟට ගිහිල්ලා අයියාගේ පිහිය ගැන හොයල බලන්ට ඕන කියලා තීරණය කළා. කුමාරිව දාලා යන්ටත් දුකයි. අයියා ගැන හොයා බලන්ටත් ඕන. ඔහු නුග ගහ ළඟට ගියා. අයියාගේ පිහිය මිට ළඟට එනකල්ම මලකඩ කාලා. අයියාට විපතක් වී තිබෙන බව ඔහු දැන ගත්තා. අයියාට පිහිට වීමට ඕනහන්දා ඔහු දඬයම බල්ලාවයි, මුවාවයි, වෘකයාවයි, හාවාවයි අරගෙන ගියා.

ඔහොම යන කොට, යන්කොට ලියෙන් හදාපු රාජ මාලිගාවක් ඔහු දැක්කා. මාලිගා බිත්ති තේක්ක ලීයෙන් හදලා. ඉස්සරහ පැත්ත බුරුත ලීවලින් හදලා. මාලිගා කුළුණ අහසට වැදෙන තරම් උසයි. අවට කිසිවකු ජේන්න නැහැ. මාලිගාව ඇතුළේ කුමාරිකාවක් ඉන්නවා.

"කුමරිය, මෙහි හිටිය මිනිස්සු කොහි ගියාද?" කියලා ඔහු ඇසුවා.

"දිග ඈ ඇති සුදු මුවාව අල්ලා ගන්ට උෆ පස්සේ ගියා. මගේ පිය රජ කුමාත් ගියා. ඒ ගොල්ලො දැන් ගල් ගැහිල, පරුවත වෙලා. දඬයක්කාරයෙකුත් සුදු මුවාව අල්ලා ගන්ට ගියා" කුමරිය කිව්වා.

"එයා තමා මගේ අයියා. ඔහුට උදව් වීමට මම යනවා!"

එඬේර මල්ලි මිදුලට බැස්සා විතරයි. දිග ඈ ඇති සුදු මුවා දුවන හැටි ඔහු දැක්කා. උෆව අල්ලා ගන්ට ඔහු උෆ පස්සෙන් දිව්වා. සුදු මුවා වේගයෙන් දුවලා, දුවලා, ගිහින් අතුරුදහන් වුණා. මීදුමක් ඇති වෙලා ඇස්

නොපෙනී ගියා. ඊට පස්සෙ, ආච්චි කෙනෙක් ගස් කොටයක් උඩ වාඩි වෙලා ගිනි තපින හැටි ඔහුට පෙනුණා. ඔහු මැහැල්ලට කතා කරලා මෙහෙම ඇහුවා:

"ආච්චියේ මේ ගල්, මේ පරුවත ඇති වුණේ කොහොමද?"

"නුඹේ සතුන්ව අත ගාන්ට මට අවසර දීපන්, ඊට පස්සේ ඔය ගල්, පරුවත ගැන කියන්නම්" මායාකාර මැහැල්ල කිව්වා.

"ආච්චියේ නුඹ බොහොම කපටියි, මාව රවටන්ට නුඹට බැහැ. පේනවද මගේ කඩුව බොහොම මුවහත්. එක පාරයි, බෙල්ල කඳෙන් වෙන්වෙව්."

මැහැල්ල බය වෙලා ඇත්ත කිව්වා:

"මේ පරුවත ඉස්සර මිනිස්සු. මේ ගල් ඉස්සර සත්තු. නුඹේ අයියත් පරුවතයක් වෙලා."

"ඒ ගොල්ලන්ට පණ දෙන හැටි කියපන්. නැතිනම් නුඹේ බෙල්ල කපා දමනවා."

"අර ගිනි මැලය පේනවද? එතැනින් අළු අහුරු අරගෙන පරුවතවලට ඉහපන්! එතකොට ඒවාට පණ ලැබෙව්."

මල්ලි අළු ඉහන්ට පටන් ගත්තා විතරයි, පරුවතවලට පණ ආවා. ඒවා නැවත මිනිසුන් බවට පත්වුණා. අයියාටත් පණ ලැබුණා. සතුන්ට පණ ලැබුණු හැටියෙම උන් මායාකාර මැහැල්ලගේ ඇහට කඩාපැනලා ඇය මරා දැම්මා.

මුළු රටම ප්‍රීති වුණා. රජතුමා තමාගේ දු කුමාරිව එඬේරාගේ අයියාට සරණ පාවා දුන්නා. ඒ කුමරිට මාලිගයෙන් එළියට යන්ට බැරිවන විදිහට මායාකාර මැහැල්ල සාප කරලයි තිබුණෙ. එම සාපයත් අවසන් වුණා.

අයියාගෙන් සමු ගෙන මල්ලි තම රටට ඇවිල්ලා කුමරියත් සමග බොහෝ කාලයක් සතුටින් ජීවත් වුණා.

දිග අ ඇති සුදු මුවාට මොකද වුණේ? මායාකාර මැහැල්ල මළ හැටියේම සුදු මුවා සිහි නැතුව ඇද වැටුණා. එතකොට ඇගේ දිස්ටිය සුදු මුවාගෙන් වෙන්වෙලා ගියා. දැන් සුදු මුවා කාටවත් වරදක් නොකර කැලෑවේ හැම තැනම යුවනවා.

Б 70802-178 / 014(01)-82 830-82

4803000000